# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1649/ 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023 திகதி

දිනය / Date — 31/12/2023 පැය 1830

## මාධ්‍ය නිවේදනය

**පොලිස් නිලධාරියෙකු අනතුරට ලක් කර පලා ගිය සැකකරුවෙකු අත්අඩංගුවට - බම්බලපිටිය පොලිස් ස්ථානය.**

2023.12.29 වන දින සවස් කාලයේ බම්බලපිටිය පොලිස් වසමේ හැව්ලොක් මාර්ගයේ වජිර පාර හන්දිය අසල රථවාහන රාජකාරී යෙදී සිටි පොලිස් කොස්තාපල්වරයෙකු තුම්මුල්ල හන්දිය දෙස සිට කිරුලපන දෙසට ධාවනය වූ කාර් රථයක් නවතා පරීක්ෂා කිරීමට යාමේදී නිලධාරියා අනතුරකට ලක් කොට හප්පා පලා ගොස් ඇති අතර, බරපතල තුවාල ලැබූ පොලිස් නිලධාරියා කොළඹ ජාතික රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබා ගෙන ඇත.

මෙහිදී රථයේ බලපත්‍ර පරික්ෂා කිරීම සඳහා ඉල්ලා සිටි පොලිස් නිලධාරියා කාර් රථය තුලට අත යොමු කිරිමෙන් පසු, රියදුරු විසින් ඕනෑකමින්ම රථයේ විදුරුව කඩිනමින් ඉහළට ඔසවා නිලධාරියාගේ අත කාර් රථයේ සිරවූ පසු රථය වේගයෙන් ඉදිරියට ධාවනය කර ඇත. ධාවනය කරන අතරතුර නතර කර තිබූ වෙනත් රථයක ගැටීමට සලස්වා ඇති අතර එම කාර් රථයේ ගැටී නිලධාරියා බිම පතිත විමෙන් පසු කාර් රථය පලා ගොස් ඇත.

සිද්ධිය සම්බන්ධයෙන් බම්බලපිටිය පොලිසිය විමර්ශන සිදුකරමින් සිටියදී කාර් රථයේ රියදුරු 2023.12.29 වන දින නීතිඥවරයෙකු මාර්ගයෙන් බම්බලපිටිය පොලිසියට ඉදිරිපත් වීමෙන් පසු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන කොළඹ 13 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

එමෙන්ම අනතුරට සම්බන්ධ කාර් රථය කෙසෙල්වත්ත පොලිස් ස්ථානය ආසන්නයේදී නවතා තිබියදී එම අවස්ථාවේදී කාර් රථයේ රියදුරුව සිටි පුද්ගලයා සමඟ පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත.

අනතුරට සම්බන්ධ කාර් රථය කුලියට වාහන සැපයීමේ ආයතනයක කාර් රථයක් වන අතර, කාර් රථය සමඟ අත්අඩංගුවට ගත් සැකකරු මෙම ආයතනයේ රියදුරෙකු වශයෙන් සේවය කරනු ලබන වයස අවුරුදු 39 ක් වන කොළඹ 13 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

සැකකරු සම්බන්ධව 2023.12.30 වන දින අලුත්කඩේ ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත රථවාහන රාජකාරියේ යෙදී සිටි නිලධාරියෙකුට අනතුරක් සිදු කර මිනී මැරීමට තැත් කිරීම, පොලිස් රාජකාරියට බාධා කිරීම, මිනී මැරීමේ චේතනාවෙන් පැහැරගෙන යාම, තුවාල සිදු කිරීම හා පොලිස් නිල ඇඳුම් වලට අනර්ථ සිදු කිරීම යන චෝදනා යටතේ කරුණු වාර්තා කිරීමෙන් පසු, ගල්කිස්ස ගරු මහේස්ත්‍රාත් තුමා කළුබෝවිල රෝහලේදී සැකකරු පරීක්ෂා කර රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

බම්බලපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**